Worked


# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,465—1958 අගෝස්තු 1 වැනි සිකුරාදා—1.8.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 2095 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 2095 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 2097 |

| | පිට |
|---|---|
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 2098 |
| මිළ පාලන දන්වීම .... .... .... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 2101 |
| " සුරාබදු ආඥාපණත " පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1958 අංක 324**

අංකය : ඩී.22/රෙක්ට/8.

**රාජකීය ලංකා නාවුක හමුදාව—නිත්‍ය නාවුක උප සේවයෙන් නිත්‍ය නාවුක හමුදාවට නිළධාරියෙක් මාරුකිරීම**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කරන ලද නිළධාරි තැන 1958 මැයි මස 27 වැනි දින සිට නිත්‍ය නාවුක උප සේව යෙන් නිත්‍ය නාවුක හමුදාවට මාරුකිරීම අනුමත කොට තිබේ :—

ලෙප්ටිනන්ට් තැන්පත් ඩබ්ලිව්. ධර්මදාස—රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 ජූලි මස 22 දින.

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 325**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේජ්.2/48.

එස්. ආර්. විජේයතිලක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 ජූලි 11 වැනි දින අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 6,954, 7,013 හා 7,397 නඩුවල තීන්දුව දීමට, 1958 ජූලි 19 වැනි දින අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 7,576 නඩුව හා අවිස්සා වේල්ලේ රික්වැස්ට් උසාවියේ අංක 533ජ් නඩුව ඇහීමට හා 1958 ජූලි 24 වැනි දින අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 7,652 නඩුව ඇහීමට, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේජ්.47/48.

ඩී. එස්. එල්. පී. අබෙයසේකර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 අගෝස්තු 27 වැනි හා 29 වැනි දිනයන්හි, පානදුරේ දිස්ත්‍රික් උසාවියේ අංක 2,118 නඩුව ඇහීමට, පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑස්සී.පීපී.5/58.

ඊ. ඇෆ්. ද සිල්වා මහතා 1958 ජූලි 10 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, ගාල්ලේ මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා ගාල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑස්සී.පීපී.5/58.

වී. ජේ. රාජරත්නම් මහතා 1958 ජූලි 10 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, මන්නාරමේ හා වවුනියාවේ මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේජ්.12/48.

ජේ. ඊ. ඒ. ඇලස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 අගෝස්තු 12 වැනි දින, කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 46,387/ඒ නඩුවේ තීන්දුව දීමට, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේජ්.21/48.

ඒ. ඊ. ආර්. කොරෙයා මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 සැප්තැම්බර් 19 වැනි දින නාවලපිටියේ මහෙසත්‍රාත් උසාවියේ අංක 4,365 නඩුව ඇහීමට, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේඑම්.2/56.

ඒ. වෛත්‍යලිංගම් මහතා 1958 ජූලි 1 වැනි දින පටන්, නැවත නියමයක් කරන තුරු, අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේජ්.45/48.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 ජූලි 19 වැනි දින, මීගමුවේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 57,716 හා 92,137 නඩුවල තීන්දුව දීමට, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේඑම්.35/48.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා ඔහුගේ වෙනත් රාජකාරි වලට අතිරේක වශයෙන්, 1958 ජූලි 16 වැනි දින පටන් 1958 අගෝස්තු 1 වැනි දින දක්වා, බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට (කතරගම පිහිටි උසාවියේ නඩු ඇහීමට).

අංකය : ජේජේ.7/48.

ජේ. ඇෆ්. ඒ. සෝස මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 ජූලි 19 වැනි දින, බලපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 22,053 හා 22,902 නඩු ඇහීමට හා බලපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 20,565 නඩුවේ තීන්දුව දීමට, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්.38/48.

පී. මලල්ගොඩ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1958 ජූලි 12 වැනි දින, කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ අතිරේක මහෙස් ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්.33ඒ/53.

වී. ෆෙක් කන්දසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. නටරාජ මහතා 1958 ජූලි 9 වැනි දින, අනුරාධපුරයේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට

අංකය: ජේඑල්.1/48.

ඩබ්ලිව්. ඊ. අබෙයකෝන් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1958 ජූලි 10 වැනි දින පටන්, හලාවත හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්.67/48.

එස්. තම්බි දුරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එසුරපඩ්හම් මහතා 1958 ජූලි 10 වැනි හා 11 වැනි දිනයන්හි, පේදුරු තුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පේදුරු තුඩුවේ අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේජේ. 40/48.

බී. ආර්. ජී. විජේයකෝන් මහතා 1958 ජූලි 11 වැනි දින, මාතලේ දිස්ත්‍රික් උසාවියේ අංක එල්. 652 නඩුව ඇහීමට හා 1958 අගෝස්තු 14 වැනි දින, මාතලේ දිස්ත්‍රික් උසාවියේ අංක එල්. 652 නඩුවේ තීන්දුව දීමට මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්.6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එසුරපඩ්හම් මහතා 1958 ජූලි 14 වැනි, 28 වැනි හා 30 වැනි දිනවල පේදුරු තුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පේදුරු තුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්.7බී/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර, හෝ නැවක නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1958 ජූලි 12 වැනි දින පටන් 15 වැනි දින දක්වා, හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජේ. 34/48.

ඒ. අයි. අබේවික්‍රම මහතා 1958 ජූලි 26 වැනි දින, කෑගල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 22,644 නඩුව ඇහීමට, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 62ඒ/57.

ජේ. ඇෆ්. ඒ. සෝස මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ඇෆ්. බිලාසේ මහතා 1958 ජූලි 18 වැනි හා 19 වැනි දිනයන්හි, බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 18/48.

ටී. සී. පී. ප්‍රනාන්දු මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, බී. ආර්. ජී. විජේයකෝන් මහතා 1958 ජූලි 27 වැනි දින පටන් 31 වැනි දින දක්වා, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 59ඒ/56.

ඒ. එම්. එෆ්. සිරිවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. බී. යටවර මහතා 1958 ජූලි 18 වැනි දින පටන් 21 වැනි දින දක්වා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජේ. 53/48.

එච්. ආර්. පීරිස් මහතා 1958 අගෝස්තු 2 වැනි දින, රත්නපුරේ මහෙස් ත්‍රාත් උසාවියේ අංක 63,035ඒ, 63,673ඒ, 63,675ඒ, 63,576ඒ නඩු ඇහීමට, 1958 අගෝස්තු 9 වැනි දින, රක්වානේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 61,502ඒ නඩුව ඇහීමට, හා 1958 අගෝස්තු 16 වැනි දින, රත්න පුර මහෙස්ත්‍රාත් උසාවියේ අංක 64,164 නඩුව ඇහීමට, රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබේ මහතා 1958 ජූලි 31 වැනි දින, පේදුරු තුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පේදුරු තුඩුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උඩලාගම මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඕ. ස්ටෙන්බො මහතා 1958 ජූලි 19 වැනි දින, පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 45/48.

වී. ටී. පණ්ඩිත ගුණවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඒ. සී. සිරිසේන මහතා 1958 ජූලි 26 වැනි හා 28 වැනි දිනයන්හි, බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 51ඒ/54.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. එම්. තර්මලිංගම් මහතා 1958 අගෝස්තු 7 වැනි දින පටන් 9 වැනි දින දක්වා, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 66ඒ/54.

සී. තනබාලසිංහම් මහතා නැති අතර, හෝ නැවක නියමයක් කරන තුරු, ටී. පී. සී. කැරන් මහතා 1958 අගෝස්තු 1 වැනි හා 2 වැනි දිනයන්හි, මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 27ඒ/51.

අයි. එම්. ඉස්මයිල් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1958 ජූලි 28 වැනි දින පටන් 31 වැනි දින දක්වා, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණා මලයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 34ඒ/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ජී. එච්. සඳරත්න මහතා 1958 ජූලි 20 වැනි දින, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කුරුණෑගල, කනදුල්ල උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය. පීඑල්/එස්. 10/53.

එම්. සමරක්කොඩි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එල්. සේනානායක මහතා 1958 ජූලි 14 වැනි දින පටන් 16 වැනි දින දක්වා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවියේ, සභාපති වශයෙන් වැඩ බැලීමට හා වන්නි හත්පත්තුවේ කටුගම්පල හත්පත්තුවේ හා හිරියාල හත්පත්තුවේ අතිරේක සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඇෆ්ජ1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සේරසිංහ මහතා 1958 ජූලි 21 වැනි දින පටන් 24 වැනි දින දක්වා, තංගල්ල දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958 ජූලි 21 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායර්‍යාලය,
තැ.පෙ. අංකය. 573,
කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

**1958 අංක 326**

අංකය : ඩී. 32/රෙක්ට.

## රාජකීය ලංකා නාවුක හමුදව—නිලධාරියෙක් උසස් කිරීම

1958 ජූනි මස 1 වැනි දින සිට වැඩ බලන ලෙප්ට්ටිනන්ට් කෙනෙකු වශයෙන්—

උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඩී. ඊ. වීරසිංහ; රාජකීය ලංකා නාවුක හමුදව.

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 ජූලි මස 23 දින.

---

**1958 අංක 327**

අංකය : ඩී. 32/රෙක්ට්.

## රාජකීය ලංකා නාවුක හමුදවේ නිලධාරීන් ස්ථිර කිරීමක්

1955 ඔක්තෝබර් මස 1 වැනි දින සිට ජොෂ්ඨතාවය ඇතිව, 1958 මැයි මස 17 වැනි දින සිට උප ලෙප්ට්ටිනන්ට් කෙනෙකු වශයෙන්—

වැඩබලන උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් ඇම්. ආර්. රාජසිංහම්, රාජකීය ලංකා නාවුක හමුදව.

1956 මැයි මස 1 වැනි දින සිට ජොෂ්ඨතාවය ඇතිව, 1958 මැයි මස 17 වැනි දින සිට උප ලෙප්ට්ටිනන්ට් කෙනෙකු වශයෙන්—

වැඩබලන උප ලෙප්ට්ටිනන්ට් තැන්පත් එච්. ජ්. සිල්වා, රාජකීය ලාංකා නාවුක හමුදව.

ජී. ද සොයිසා.
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 ජූලි මස 23 දින.

---

**1958 අංක 328**

අංකය: ඩී. 33/රෙක්ට්.

## රාජකීය ලංකා ගුවන් හමුදව—උසස් කිරීම

1951 ලංකා ගුවන් හමුදවේ (නිත්‍ය සහ නිත්‍ය උප සේවය) රෙගුලාසි මාලාවේ 3 වැනි රෙගුලාසිය යටතේ පහත සඳහන් කරන ලද උසස් කිරීම් කර ඇත:—

1958 ජූනි මස 15 වැනි දින සිට,ජ්ලයිං ඔපිසර්වරුන් වශයෙන් :—

| | |
|---|---|
| පයිලට් ඔපිසර් නල්ලතම්බි සන්ගරපිල්ලෙ | — ජ්. ටී. සී. |
| පයිලට් ඔපිසර් පයියාගලගේ නොඑල් සරණපාල ප්‍රනාන්දු | — ජ්. ටී. සී. |
| පයිලට් ඔපිසර් ජෝසප් තිමොති රෙක්ස් ප්‍රනාන්දු | — ජ්. ටී. සී. |
| පයිලට් ඔපිසර් ජෝසප් වික්ටර් පොන්සේකා අබයකෝන් | — ජ්. ටී. සී. |

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ 1,
1958 ජූලි මස 23 දින.

---

**1958 අංක 329**

අංකය : ජී. 25/43/69.

අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින් ඇස්. ටී. අබේසේකර මහතා කොළඹ වරායේ කොමිෂන් සභාවේ පරිපාලන ලේකම්ධුරය දරණ කාලයතුල කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදන විනිශ්චයකාරවරයෙකු වශයෙන් පත්කර ඇත්තේය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 මැයි මස 3 වෙනි දින සිට ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තුවේ ආදයම් පාලක ධුරය දරණ කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයට ඇස්. සිරිනිවාසන් මහතාද,

1958 ජූලි මස 15 වෙනි දින සිට ජේ. සී. ඩබ්ලිව්. වාකිස්ටා මහතා නැවත වැඩ භාරගන්නාතුරු, නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිඹුල කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ජී. පී. එච්. ද සිල්වා මහතා ද,

1958 ජූලි මස 15 වෙනි දින සිට ඩී. ඇස්. එදිරිසිංහ මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගන්දහය කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. බී. මෙගසූරිය මහතාද,

1958 ජූලි මස 16 වෙනි දින සිට එච්. බී. සමරකෝන් මහතා නැවත වැඩ භාරගන්නාතුරු, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දකුණු දඹදෙනි උඩුකහ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඇස්. ඇම්. අබයරත්න මහතා ද,

1958 ජූලි මස 18 වෙනි දින සිට ජේ. ඩී. ජ්. ජයසේකර මහතා නැවත වැඩ භාරගන්නාතුරු, ගාලු දිස්ත්‍රික්කයේ හොරන්ගල්ල, අඹන සහ වැහිහේන යන විදන ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. ජ්. ද. ඇස්. ආර්. විජේසිංහ මහතා ද,

1958 ජූලි මස 19 වෙනි දින සිට යූ. බී. පෙතියගොඩ මහතා නැවත වැඩ භාරගන්නාතුරු, මහනුවර දිස්ත්‍රික්කයේ ගන්අට පලාත කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට සී. බී. මඩවල මහතා ද,

1958 ජූලි මස 25 වෙනි දින සිට කේ. බී. ඇම්. හුදුබණ්ඩා මහතා නැවත වැඩ භාරගන්නා තුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ වැල්ලවාය කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඩී. සී. ඩබ්ලිව්. බස්නායක මහතා ද,

1958 ජූලි මස 27 වෙනි දින සිට ආර්. බී. මුල්ලගම මහතා නැවත වැඩ භාරගන්නා තුරු, බදුල්ල දිස්ත්‍රික්කයේ දෙහිවිනි පලාතේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඇල්. ජේ. ගුණවර්ධන මහතා ද,

1958 ජූලි මස 28 වෙනි දින සිට ඩී. බී. ලියනගෙදර මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ වැව්ගම් පත්තුවේ ආදයම් පාලක ධුරයෙහි වැඩ බලන කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට එච්. ඇම්. සබානායක මහතා ද,

1958 ජූලි මස 28 වෙනි දින සිට ඩී. ඇම්. රංබණ්ඩා මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මහනුවර දිස්ත්‍රික්කයේ උඩගම්පහ සහ පල්ලේගම්පහ යන කෝරළවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩ බැලීමට ඇල්. බී. සමරකෝන් මහතා ද,

1958 ජූනි මස 26 වෙනි දින සිට මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ හා නැගෙනහිර කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයට ටී. විමල සිංහ මහතා ද,

පත්කර ඇත.

එසේම 1958 ජූලි මස 11 වෙනි දින අංක 11,423 දරණ ගැසට් පත්‍රයේ 293 වෙනි නිවේදනයේ සඳහන් මාතලේ දිස්ත්‍රික්කයේ කොහොන්සිය පත්තුවේ මාතලේ දකුණ සහ නැගෙනහිර කොට්ඨාශයට හදිසි මරණ පරීක්ෂක ධුරයට ටී. විමලසිංහ මහතාගේ පත්වීම අවලංගුකර ඇත.

ජී. සී. ටී. ජ්. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථාවර ලේකම්.

1958 ජූලි මස 28 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

---

**1958 අංක 330**

අංකය : ඊබී/ඒ 204/2.

අර්ථ නිරූපන ආඥපනතේ දෙවන පරිච්ඡේදය 10බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත් කිරීම් කර ඇති බව මෙයින් දනුම් දෙනු ලැබේ :—

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ඩී. ආර්. ඇල්. බාලසූරිය මහතා 1958 ජූනි මස 4 වෙනි දින සිට ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන් පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල් වශයෙන්.

ගාල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් සී. ජේ. සේරසිංහ මහතා 1958 ජූනි මස 16 වෙනි දින සිට, ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන් දකුණු පළාතේ පිස්කල්, ගාල්ල පාලන දිස්ත්‍රික්කයේ රේගු අයකැමි, ගාල්ල පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් කැඩී බිඳී ගිය යාත්‍රා භාර ගන්නා නිලධාරී.

යාපනය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ විධානය පිට ක්‍රියා කරන එම දිස්ත්‍රික්කයේ උප ඒජන්ත තැන්පත් ඒ. තෙව්වනා මූර්ති මහතා ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන් 1958 ජූලි මස 4 වෙනි දින සිට යාපනයේ අතිරේක බන්ධනාගාර අධිකාරී.

බදුල්ලේ පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ විධානය පිට ක්‍රියා කරන එම දිස්ත්‍රික්කයේ උප ඒජන්ත තැන්පත් ඇන්. ඩී. ජයවීර මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන් 1958 ජූලි මස 7 වෙනි දින සිට බදුල්ලේ අතිරේක සහකාර බන්ධනාගාර අධිකාරී.

හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ටී. සිවඥනම් මහතා ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන් 1958 ජූලි මස 1 වෙනි දින සිට හම්බන්තොට පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්, හම්බන්තොට පාලන දිස්ත්‍රික්කයේ රේගු අයකැමි, හම්බන්තොට නියෝජ්‍ය මාස්ටර් ඇටෙන්ඩන්ට්, හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය සම්බන්ධ යෙන් කැඩි බිඳී ගිය යාත්‍රා භාර ගන්නා නිලධාරි සහ හම්බන්තොට පාලන දිස්ත්‍රික්කයේ අතිරේක පොලිස් අධිකාරී.

අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ඩී. සී. ඇල්. අමරසිංහ මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන් 1958 ජූලි මස 7 වෙනි දින සිට උතුරු මැද පලාතේ පිස්කල් සහ අනුරාධ පුරයේ බන්ධනාගාර අධිකාරී.

ඇස්. සී. ප්‍රනාන්දු,
ස්ථිර ලේකම්.

ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය,
කොළඹ 7,
1958 ජූලි මස 22.

**1958 අංක 331**

අංකය : ඊබී/ඒ-258.

ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා පහත සඳහන් පත්වීම් කිරීමට සතුටු වී ඇත :—

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ඩී. ආර්. ඇල්. බාලසූරිය මහතා, 1958 ජූනි මස 4 වෙනි දින සිට ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන්, පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

ගාල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් සී. ජේ. සේරසිංහ මහතා 1958 ජූනි මස 16 වෙනි දින සිට, ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන්, ගාල්ලේ නාගරික සීමාවලට ඇතුලත් වන ප්‍රදේශය හැර ගාල්ල පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ටී. සිවඥණම් මහතා 1958 ජූලි මස 1වෙනි දින සිට, ස්වකීය රාජකාරි වලට අතිරේක වශයෙන් හම්බන්තොට පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත, තැන්පත් ඩී. සී. ඇල්. අමරසිංහ මහතා 1958 ජූලි මස 7 වෙනි දින සිට ස්වකීය රාජකාරිවලට අතිරේක වශයෙන් අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රෝල් ආඥපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

ඇස්. සී. ප්‍රනාන්දු
ස්ථිර ලේකම්.

1958 ජූලි මස 24 වෙනි දින,
ස්වදේශ කටයුතු භාර ඇමති කාර්‍යාලයේ දී ය.
කොළඹ 7.

---

**1958 අංක 332**

වර්ෂ 1951කේ අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥපනතේ 12 (1) වැනි වගන්තිය යටතේ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1958 ජූලි 16 වැනි දින පටන් 1959 ජනවාරි 15 වැනිද වනතුරු හම්බන්තොට අධිකරණ කොට්ඨාශයේ ක්වාසි තනතුරට හම්බන්තොට " සිනාර් විලා " හි තුවන් කිච්ල් බුරා මහතා පත් කරන්ට යෙදුනා ඇත.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ නිත්‍ය ලේකම්.

1958 ජූලි 14 වැනි දින,
කොළඹදීය.

---

**1958 අංක 333**

ජෙරල්ඩ් එබනේසර් අබේනායක මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 ජූලි මස 16 වැනි දින,
කොළඹදීය.

---

**1958 අංක 334**

සෝමේන්ද්‍රරානි සෝමසේකරම් මහත්මිය යාපනය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 ජූලි මස 16 වැනි දින,
කොළඹදීය.

---

**1958 අංක 335**

කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් හේරත් මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩා හේරත් මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 ජූලි මස 16 වැනි දින,
කොළඹදීය.

---

**1958 අංක 336**

උඩපිලමේස්ත්‍රිගේ චන්ද්‍රවංශ කීර්තිනන්ද පැඩිඩිලියන් මහතා බදුල්ල අධිකරන කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 ජූලි මස 16 වැනි දින,
කොළඹදීය.

---

**1958 අංක 337**

වාණිජ හා වෙළඳ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1958 ජූලි මස 1 වැනි දින සිට රේගුවේ බඩු බැම් අතිරේක සමීක්ෂක සිවිල් නිලධාරි සී. විස්වාසම් මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව ආනයන හා අපනයන සහකාර පාලක වශයෙන් පත් කරන ලදී.

වී. එල්. වීරසිංහ.
වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ වැඩ බලන
ස්ථිර ලේකම්.

1958 ජූලි මස 25 වැනි දින,
කොළඹ, වෙළඳ ඇමති කාර්‍යාලයේදීය.

---

# ආණ්ඩුවේ නිවේදන

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට චාර්ල්ස් ඊට්න් ද සිල්වා සේනාරත්න මහතාට දෙන ලද බලපත්‍රය නොතාරිස්වරුන් පිළිබඳ ආඥපනතේ (91 වැනි පරිච්ඡේදයේ) 19 වැනි වගන්තිය යටතේ වර්ෂ 1958 ජූලි මස 19 වැනි දින ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අවලංගු කරන ලද බව මෙයින් දනුම් දෙමි.

1958 ජූලි 12 වැනි දින,
කොළඹ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

---

## 4බී පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පණත

**පණතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි**

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචි කිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝසප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පකිස්තානි නිවැසි (පුරවැසි) පණතේ දහ වැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උප ලේඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පණතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමත කිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුඬතාවයක් ඇත් නම් කුමක කාරණා නිසා එවැනි විරුඬතාවය මූල් කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිඬකල දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමත කරන බවයි.

විරුඬවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුඬවීමේ නිවේදනයකම ඇතුළත් විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියා
පදිංචි කිරීමේ වැඩබලන කොමසාරිස් තැන.

කොළඹ.
1958 වූ ජූලි මස 28 වෙනි දිනදීය.

## උපලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි නොම්මරය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අපේක්ෂා සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අපේක්ෂා සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| P 2498—1.10.50 .. | පෙරුමාල් වයිතිලිංගම්, අග්‍ර ඌව වත්ත, අග්‍රපතන | තිල්ලෙයිඅම්මාල් (භාර්යාව), සින්නතම්බි (පුතා), තනලෙච්චුමි (දුව) |
| P 6185—17.2.51 .. | කදිර්වේල් රාමසාමි, බැල්මොරල්වත්ත, අග්‍රපතන ... | රාමායි (භාර්යාව), මුත්තුසාමි (පුතා), නඩරාජා නොහොත් නඩේසන් (පුතා), ගෝපාලක්‍රිෂ්නන් නොහොත් ගෝපාල් (පුතා), ආරුමුගම් (පුතා), මාරියායි (දුව) |
| P 6367—17.2.51 .. | වෙන්ගඩාසලම් මුත්තුසාමි, ක්ලයිඩ්ස්ඩේල් වත්ත, අග්‍රපතන | අයියම්මාල් (භාර්යාව), ක්‍රිෂ්නම්මාල් නොහොත් කිච්නම්මා (දුව) |
| P 6391—17.2.51 .. | පෙරුමාල් ගෝවින්දන්, ක්ලයිඩ්ස්ඩේල් වත්ත, අග්‍රපතන | කරුප්පායි (භාර්යාව) |
| P 6453—17.2.51 .. | රාමසාමි සින්නසාමි, ක්ලයිඩ්ස්ඩේල් වත්ත, අග්‍රපතන | මූක්කායි (භාර්යාව), වීරම්මා (දුව), මල්ලම්මා නොහොත් නල්ලම්මා (දුව), රාමයියා (පුතා), රෙන්ගසාමි (පුතා), සිවපාකියම් (දුව), නඩරාජා (පුතා), ලෝගම්බාල් නොහොත් ලෝකම්බා (දුව) |
| P 6465—17.2.51 .. | වෙන්ගට්ටන් පෙරුමාල්, ක්ලයිඩ්ස්ඩේල් වත්ත, අග්‍රපතන | එල්ලම්මාල් (භාර්යාව), සෙවපාදන් නොහොත් රාමන් (පුතා) |
| P 7047—4.3.51 .. | අරුලාන්දු මරියදාස්, විස්පෝඩ් වත්ත, අග්‍රපතන ... | කානික්කම් නොහොත් කානික්කමේරි (භාර්යාව), පාකියනාදන් (පුතා), මරියමේරි (දුව), අම්බ්‍රෝදම් (පුතා) |
| P 7132—4.3.51 .. | අරුලාන්දු තෝමස්, ආඩ්ලෝ වත්ත, අග්‍රපතන ... | පාකියම් නොහොත්, අන්නම්මා (භාර්යාව), ජලෝමනී දාස් (පුතා) |
| P 7185—4.3.51 .. | අන්නමලෙයි තාන්ඩවන්, විස්පෝඩ් වත්ත, අග්‍රපතන | අරුක්කානි (භාර්යාව), පිච්චායි නොහොත් පිච්චම්මා (දුව), වීරම්මා (දුව), අන්නමලෙයි (පුතා), ආරුමුගම් (පුතා) |
| O 9831/R—28.7.51 .. | දේවසගායම් ෂාන්දප්පන්, වන්ගිඹය වත්ත, නානුඔය | ජෙබමාලෙයි (භාර්යාව), ලූදිස් ලාවුස් (පුතා) |
| R 42—30.9.50 .. | වරදප්පන් මුත්තුසාමි, පහළ කොටස, වන්ගිඹය වත්ත, නානුඔය | අන්ගම්මා (භාර්යාව), පෙරියසාමි (පුතා), මුරුගේසු (පුතා) |
| R 812—2.12.50 .. | කදිරවේල් වීරමුත්තු, ඇවෝකා වත්ත, නානුඔය ... | සෙල්ලායි (භාර්යාව) |
| R 1580—18.3.51 .. | සිරන්ගන් පෙරුමාල්, මහගස්තොට වත්ත, නුවරඑළිය | වේලායි (භාර්යාව) |
| R 1581—18.3.51 .. | පලනියාන්ඩි මුත්තයියා, මහගස්තොට වත්ත, නුවරඑළිය | මාරියායි (භාර්යාව), සින්නම්මා (දුව), සෙල්වරාජු (පුතා) |
| R 1606—18.3.51 .. | කන්දසාමි සුබ්‍රමානියම්, මහගස්තොට වත්ත, නුවරඑළිය | මීනාම්බාල් (භාර්යාව), පූවති (දුව), ගනේසමූර්ති (පුතා) |
| R 1753—14.4.51 .. | පේච්චි සෙල්ලන්, කැල්සේ වත්ත, නානුඔය ... | රෙත්නති (භාර්යාව), මූක්කයියා (පුතා), නිලාබරම් (පුතා), නවමනි (දුව) |
| R 1754—14.4.51 .. | කාලියන් කදිරවේල්, කැල්සේ වත්ත, නානුඔය ... | ආරායි (භාර්යාව), තමරායි නොහොත් තන්ගාල් (දුව), පෙරියනාච්චි (දුව), පොන්නම්මා නොහොත් පෙරිඅක්කා (දුව), තන්ගාල් (දුව) |
| R 2409—22.4.51 .. | කරුප්පන් සන්දනම්, ලවර්ස් ලීප් කොටස, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | පේච්චෙයිඅම්මා (භාර්යාව), කාලිමුත්තු නොහොත් රාසයියා (පුතා), පොට්ටු (දුව), සෙල්ලම්මා නොහොත් සෙරුම්බායි (දුව), තන්ගම්මා (දුව), වීරයියා (පුතා), ෂන්මුගම් (පුතා), සීතායි (දුව) |
| R 2413—22.4.51 .. | පෙරියතම්බි කදිරවේල්, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | පූවන් (පුතා) |
| R 2372—22.4.51 .. | පලනියාන්ඩිගේ වැන්දඹුවවූ මූක්කායි, ලවර්ස් ලීප් කොටස, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | පලනියාන්ඩි රාමායි (දුව) |
| R 2381—22.4.51 .. | රාමසාමි පෙරියතම්බි, ලවර්ස්ලීප් කොටස, පෙඩ්රෝ වතුයාය නුවරඑළිය | පාප්පාති (භාර්යාව), මාරිමුත්තු නොහොත් වේළු (පුතා), තෙයිවානි (දුව), සතියනාදන් (පුතා), සෙල්වමනි (දුව), රුක්මනි (දුව), නවරත්නම් (පුතා) |
| R 2390—22.4.51 .. | ගෝවින්දන් මුත්තු, ලවර්ස් ලීප් කොටස, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | සන්දනම් (භාර්යාව), සෙලම්බායි (දුව), ආරායි (දුව), කාලිමුත්තු (පුතා), වීරමුත්තු (පුතා), මාරියායි (දුව) |
| R 2401—22.4.51 .. | නාච්චිමුත්තු කදිර්වේළු, ලවර්ස් ලීප් කොටස, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | අන්ගම්මා (භාර්යාව) |
| R 2405—22.4.51 .. | මෙයියන් කරුප්පන්, ලවර්ස් ලීප් කොටස, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | තයිළී (භාර්යාව), මූක්කයියා (පුතා), මුනිඅම්මා (දුව), වේලායි (දුව) |
| R 2637—22.4.51 .. | ගාබ්‍රියෙල්ගේ දුව ජෝන් මාරියම්මාල්, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | ජෝන් මයිකල් (පුතා) |

| ඉල්ලුම් පත්‍රයෙහි අංකය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| R 2675—22.4.51 .. | ඉරුසන් රාමසාමි, ලවර්ස් ලීප් කොටස, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | වල්ලි (භාර්යාව), සදච්චි (දුව), කන්දසියා (පුතා), සරෝජිනි (දුව), ෂන්මුගායි (දුව), අන්නකිලි (දුව) |
| R 2702—22.4.51 .. | මාරිමුත්තු ආරුමුගම්, පෙඩ්රෝ වතුයාය, නුවරඑළිය | සිරන්ගායි (භාර්යාව) |
| R 3689—22.4.51 .. | වීරප්පන් කාමාච්චි, තේස්බි වත්ත, නුවරඑළිය ... | ඉදුම්බන් ලෙච්චුමි (දුව) |
| R 4006—20.5.51 .. | රාමන් වේලයුදම්, පෝට්ස්වුඩ් කොටස, කෝට් ලොජ් වත්ත, කදපොල | රාමායි (භාර්යාව), ඉන්ද්‍රමනි (දුව) |
| R 4023—20.5.51 .. | කන්දසාමි සුප්පයියා, පෝට්ස්වුඩ් කොටස, කෝට් ලොජ් වත්ත, කදපොල | නල්ලම්මා (භාර්යාව) |
| R 5167—14.7.51 .. | සෙන්ගමලෙයි නල්ලප්පන්, එඩින්බර්ග් වත්ත, නානුඔය | පලනියායි (භාර්යාව), නයිනම්මා (දුව) |
| R 5177—14.7.51 .. | නල්ලතම්බි සිදම්බරම්, එඩින්බර්ග් වත්ත, නානුඔය | තයිලම්මා (භාර්යාව) |
| R 5362—14.7.51 .. | රාමසාමි වෙල්ලකුට්ටි, එඩින්බර්ග් වත්ත නානුඔය | සෝලෙයිඅම්මා (භාර්යාව), සුන්දරරාජ් (පුතා), පෙරුමාල් (පුතා), ආන්දම්මා (දුව), රාමසාමි (පුතා), පාප්පූ (පුතා), අලගු (පුතා), දුරෙයිසාමි (පුතා) |
| R 5363—14.7.51 .. | මුත්තුකුමාරන් ආරන්, එඩින්බර්ග් වත්ත, නානුඔය | විසාලාච්චි (භාර්යාව), පුෂ්පම් (දුව), සෙල්වරාජ් (පුතා) |
| R 5374—14.7.51 .. | රාමසාමිගේ වැන්දඹුවවූ—අරුක්කනි, එඩින්බර්ග් වත්ත, නානුඔය | ගෝවින්දම්මා (දුව), රාජේන්ද්‍රම් (පුතා) |
| R 5397—14.7.51 .. | රෙන්ගසාමි සිලම්බරම්, එඩින්බර්ග් වත්ත, නානුඔය | අන්ගු (භාර්යාව), අන්ජලෙයි (දුව), සිවපාකියම් (දුව), මාරියායි (දුව) |
| R 5444—14.7.51 .. | සවරිමුත්තු ආරෝකියම්, එඩින්බර්ග් වත්ත, නානුඔය | පරාපරම් (භාර්යාව), රායප්පන් (පුතා), අඩෛයික්කලම් (පුතා), අප්පුදමේරි (දුව), සවරිමුත්තු (පුතා), ඥානප්‍රගාසම්මා (දුව), අන්තෝනිඅම්මා (දුව), ආදිසිත්‍ර සිලෙවමුත්තු (පුතා) |
| R 5463—14.7.51 .. | සින්නයියා මන්ගනාදන්ගේ—වැන්දඹුවවූ තෙයිවානෙයි, එඩින්බර්ග් වත්ත, නානුඔය | සෙල්ලයියා (පුතා), මනිරාසු (පුතා) |
| V 1153/W—30.11.50 .. | අරසන් පෙරියන්නන්, එල්වැබ් වත්ත, පස්සර ... | කදිරායි (භාර්යාව), අරසන් නොහොත් කාලිමුත්තු (පුතා), පලනියන්ඩි (පුතා), පාකියම් (දුව) |
| V 4430/W—20.10.50 | අරුනාසලම් පනයඩියාන්, වැවකැලේ වත්ත, නමුනුකුල | පේච්චායි (භාර්යාව), සෙල්ලමුත්තු (පුතා) |
| Y 4583/W—23.6.51 .. | ආවාදෙයි කුමාරවේල්, ඉහළ කොටස, ඇල්ලවත්ත වත්ත, ඇල්ල | කාවේරි (භාර්යාව), ගනකසබාපති නොහොත් රාසලිංගම් (පුතා), පූෂ්පරාජු නොහොත් තන්ගවේල් (පුතා), ත්‍රිවිනමූර්ති නොහොත් නඩරාජා (පුතා), පුෂ්පම් (දුව) |
| Y 7886/W—3.8.51 .. | පලනිවේල් සුබ්‍රමානියම්, උඩවත්ත, කඩේ, උඩුවෙර වත්ත, හාලිඇල | තෙයිවානිඅම්මාල් (භාර්යාව) |
| Y 1786/V/W—30.11.50 | සුප්පරායන් සුප්පයියා, ගව්ස කොටස, ගලපිටකන්ද වත්ත, නමුනුකුල | සෙල්ලම්බායි (භාර්යාව), මුත්තම්මාල් (දුව), නාගබූෂනම් (දුව), තෙයිවානෙයි (දුව), ලෙච්චිමි (දුව), සෙල්වරාස් (දුව) |
| Y 4562/V/W—5.7.51 .. | අප්පසාමි අලගර්සාමි—නොහොත් පොන්නුසාමි—නොහොත් පෙරුමාල්, අංක : 5/ඒ, නමුනුකුල බසාර්, නමුනුකුල | පොන්නුතායි (භාර්යාව) |
| X 5423—3.7.51 .. | වේදි වේළු, ක්‍රෝග් වත්ත, බන්ඩාරවෙල ... | පාලාමනි (භාර්යාව), කරුප්පයියා (පුතා), රාසමානික්කම් (පුතා) |
| X 5981—18.7.51 .. | පාපූජ් සෙයියනාබී, රොහැම්ටන් වත්ත, හපුතලේ ... | අමීර් බී (දුව) |
| X 6182—26.7.51 .. | කාලියන්නන් සෙල්ලප්පන්, සාන්ත කැතරින් කොටස, නයාබැද්ද වත්ත, බන්ඩාරවෙල | කාලියම්මා (භාර්යාව), රාමයියා (පුතා), පාප්පු (දුව), මහලිංගම් (පුතා) |
| X 6245—26.7.51 .. | වෙල්ලයන් වීරමලෙයි, සාන්ත කැතරින් කොටස, නයාබැද්ද වත්ත, බන්ඩාරවෙල | වීරායි (භාර්යාව), අලගායි (දුව), සිට්ටු (දුව), පේච්චි (දුව), සන්ගන් (පුතා), සින්නම්මා (දුව), අලගමලෙයි (පුතා), පොන්නයියා (පුතා), අලගම්මා (දුව) |
| X 6263—26.7.51 .. | කදිරවේළුගේ පුතා—ඇස්. කන්දසාමි, සාන්ත කැතරින් කොටස, බන්ඩාරවෙල | රාජේන්දිරන් (පුතා) |
| X502/Y—4.12.50 .. | වයිරන් සින්නයියා, ඩොව්ලන්ඩ්ස් කොටස, සාර්නියා වතුයාය, බදුල්ල | සීරන්ගම්මා (භාර්යාව) |
| Z 3084—24.7.51 .. | නල්ලතම්බි සුබ්‍රමානියම්, අංක : 122, කෙළින් වීථිය, කොස්ලන්ද | සෙල්ලම්මාල් (භාර්යාව), සෙල්ලයියා (පුතා), තනපාකියම් නොහොත් සීල්මාලා (දුව), නාගරත්නම්මා (දුව), සෙල්වරාසා (පුතා); රාජලෙච්චිමි (දුව) |
| AA 955—14.5.51 .. | රෙන්ගගවන්දර් කාලී, හෝටන් වත්ත, නිවිතිගල ... | පොන්නම්මා (භාර්යාව), කිට්නම්මාල් (දුව), කාලීඅම්මාල් (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි නොම්මරය සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියාපදිංචි කිරීමට අයැද් සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම් කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| AA 1556—17.7.51 .. | කාලියප්පන් සින්නආරුමුගම්, පදුගම්පොල කොටස, රිල්හේන වතුයාය, පැල්මඩුල්ල | සෙල්ලායි (භාර්යාව), මුරුගයියා (පුතා), පාර්වදි (දුව) |
| AA 4853—30.7.51 .. | බෝදිනායිකන් අයියාළු, රිල්හේන වතුයාය, පැල්මඩුල්ල | ලෙච්චිමි (භාර්යාව), නාරායනසාමි නොහොත් මල්වාග නම් (පුතා), වරදරාජ් (පුතා), කෙන් ගම්මාල් (දුව), කිට්නසාමි නොහොත් කිට්නන් (පුතා) |
| AA 5177—1.7.51 .. | පලනියප්පන් සෙන්ගෝදන්, මැද කොටස, දුම්බර වත්ත, ඉන්ගිරිය | අන්ගම්මා (භාර්යාව), කවුන්දියායි නොහොත් කවුන් දියම්මාල් (දුව), පද්මාවතී (දුව) |
| AA 7695—8.7.51 .. | ආරුමුගම් මාරිමුත්තු, අංක 5 කොටස, පැල්මඩුල්ල වතුයාය, පැල්මඩුල්ල | සිවනම්මා (භාර්යාව), සෙල්වජෝති (පුතා) |
| BB 1505—26.7.51 .. | මොන්නමොහමඩ් සින්දමාදර්, අංක 24, කෙළින් වීදිය, කහවත්ත | අසන් රහමතුම්මා (භාර්යාව) |
| BB 7777—4.8.51 .. | පෙරුමාල්ගේ දුව ග්‍රේස්මේරි නොහොත් රාමායි, ස්ප්‍රිංවුඩ් වතුයාය, රක්වාන | වේලයුදම් පරිමාලම් (දුව) |
| BB 10654—2.8.51 .. | රාමන් කදිරවේළු, පී. ඩබ්ලිව්. ඩී. ලයින්ස්, ඇල්ලපොල, බලන්ගොඩ | වීරායි (භාර්යාව) |
| DD 2170—16.7.51 .. | පෙරුමාල් ගුරුසාමි, ගේට්ටුව අසල කඩේ බාරේ, පරකඩුව | ජානකි (භාර්යාව), ගනේසන් (පුතා) |

---

## 1945 අංක 46 දරණ සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපන) ආඥපණත.

### නියෝගය

1947 සැප්තැම්බර් 24 වැනි දිනය හා 9,773 අංකය දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කෙරුණු ප්‍රකාශනයෙන් සංශෝධිත ප්‍රකාර, 1945 අංක 45 දරණ සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපණ) ආඥ පනතේ 3 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, කෘෂිකර්ම හා ආහාර අමාත්‍ය තැන්පත් දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම මෙම නියෝගය මගින්, 1958 ජූනි 20 වැනි දිනය හා 11,365 අංකය දරන ගැසට් පත්‍රයේ පළ කෙරුණු නියෝගයෙන් අන්තිම වරට සංශෝධනය කරන ලද ප්‍රකාර, 1953 දෙසැම්බර් 11 වැනි දිනය හා 10,621 අංකය දරන ගැසට් පත්‍රයේ පළ කළ නියෝගය, ඊට යාකළ උප ලේඛනයේ 1 වැනි තීරයේ අගට පහත දක්වෙන කොටස ඇතුලත් කොට, සංශෝධනය කරමි :—

" සමරකෝන් ජයසේකර සුමනසේකර බණ්ඩා "

ඩී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

1958. 7. 26. වැනි දින,
කොළඹ.

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නිවේදනයයි

### කුරලෙඩ සහ කට ලෙඩ

කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොටසට අයත් කීරවැළි පත්තුව (නැගෙනහිර හා බටහිර) සහ ඕතර පත්තුව තුළ ගවයින් අතර කුර ලෙඩ සහ කට ලෙඩ රෝගය පැතිර යන බැවින්, කෑගල්ල දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැන්පත් විජේපාල ටියුඩර් ජයසිංහ වන මා විසින් සතුන්ගේ බෝවෙන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

**කීරවැළිපත්තුවට (නැගෙනහිර හා බටහිර) සහ ඕතරපත්තුවට මායිම්**

උතුරට : මහ ඔය ;
නැගෙනහිරට : හාපිටිගම් කෝරළේ මායිම ;
දකුණට : දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම මායිම ;
බස්නාහිරට : උතුරු සහ දකුණු කඩූපිට පත්තුවල සහ ගන්දෙලහ පත්තුවේ මායිම්.

2. මෙම නිවේදනයේ සඳහන් දින සිට මාසයක් ඇතුළත ගවයින් හෝ ගවයින් බැඳි කරත්ත මෙම ප්‍රදේශය ඇතුළත ගෙනයාම නොකළ යුතු බව ඉහතකී ආඥපනතේ 7 වැනි වගන්තිය යටතේ නිවේදනය කරමි.

3. සියලුම ගවයින් අයිතිකරුවන් හා කරත්ත කරුවන් 1937තේ බෝවෙන රෝග සම්බන්ධ ආඥපනතට සැලකිල්ල යොමුකළ යුතු බවද, මෙහි ඉහත සඳහන් ප්‍රදේශය බෝවෙන රෝග ග්‍රස්ථ ප්‍රදේශයක් ලෙස සලකා කටයුතු කරන ලෙසද මෙයින් දන්වමි. මෙ පිළිබඳ වැඩි විස්තර නෙලුන්දෙනියේ පිහිටි බෙලිගල් කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කාර්යාලයෙන් හෝ මෙම කච්චේරියෙන් දැනගත හැකිය.

ඩබ්ලිව්. පී. ජයසිංහ,
කෑගලු දිසාවේ රජයේ දිසාපතිතැන.

වර්ෂ 1958 වෙ ජූලි මස 22 වැනි දින,
කෑගල්ලේ කච්චේරියේදීය.

## ගවයින් අතර කුරලෙඩ සහ කටලෙඩ රෝගය පැතිරයාම

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ මාගුල් ඕතොට කෝරළයේ ගවයින් අතර කුරලෙඩ සහ කටලෙඩ නමැති රෝගය පැතිරීයන බැවින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තැන්පත් ඇන්තනි ලොයිඩ් පෙරේරා වන මා විසින්, සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට : නැගෙනහිර මාගුල් සහ ගන්තිහ කෝරළ ;

දකුණට : දැදුරු ඔය ;

නැගෙනහිරට : කටුවන්න සහ ගන්තිහ කෝරළ;

බස්නාහිරට : බටහිර මාගුල් කෝරළය ;

2. මෙම ආඥපණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරනලද, ඉහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයින් හෝ ගවයින් බඳිනාලද වාහන මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙනයෑම, තහනම් කරමි.

3. තවද 1937 දී සම්මත කරනලද " සතුන්ගේ බෝවන රෝග " පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරනලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මාහෝ පශු වෛද තැනගෙන් හෝ වන්නි හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපතිතැන.

1958ක් වූ ජූලි මස් 12 වැනි දින,
කුරුණෑගල කච්චේරියේදීය.

## කොළඹ දිස්ත්‍රික්කයේ 1957—58 යන වර්ෂයේ ගවයන් හණ නිවරණ කිරීමේ වැඩ සටහන

1943 ඔක්තෝබර් මස 15 වෙනි දින පළවුනු අංක 9,181 දරණ රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණ ලද ගවයින් හණ නිවරණ කිරීම පිළිබඳ නීති මාලාවේ 3 (3) වගන්තිය අනුව කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළයේ ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ ගවයින් හණ නිවරණ කිරීමේ වැඩ සටහන මහජනයාගේ දනගැනීම පිණිස මේ පහත ප්‍රසිද්ධ කරණු ලැබේ.

1958.7.22 වෙනි දින,
කොළඹ කච්චේරිය.

ජී. පී. තම්බයියා,
කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

### 1957–58 වර්ෂයට හාපිටිගම් කෝරළයේ ගවයින් හංවඩුගැහීම පිළිබඳව වැඩ පිළිවෙල

| කොට්ඨාශ නොම්මරය | වසම | නිවරණ කරන ස්ථානය | දිනයන් |
|---|---|---|---|
| 2. | ලෝළුවාගොඩ, තලහේන, ගොඩකලාන, කදන්ගමුව, නුගදෙනිය, කහටපිටිය සහ බැද්දෙගෙදර | අලුත්වත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 3. | නාල්ල, ගිරිඋල්ල, දෙල්වල, මඩුගහවත්ත සහ කිතලවලාන | දෙමටගහවත්ත නමැති ඉඩමේදී | 25.8.58 |
| 4. | කහදව; මාලදෙනිය සහ ඇලපිලියාව | වෙලබඩවත්ත නමැති ඉඩමේදී | 31.8.58 |
| 5/6 | හේනෙගම, මිණිඹළුව, කන්ඩලම සහ දෙමටහැන්ත | පින්නගොල්ලවත්ත නමැති ඉඩමේදී | 31.8.58 |
| 7. | හකුරුකුඹුර | කොච්චිගෙවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 8. | මුගුරුගම්පොල | හැලගහවත්ත නමැති ඉඩමේදී | 16.8.58 |
| 9. | මීරිගම | බෝමළුවවත්ත නමැති ඉඩමේදී | 17.8.58 |
| 10. | වල්බෝතලේ | වල්බෝතලේවත්ත නමැති ඉඩමේදී | 25.8.58 |
| 11. | මඳුරුපිටිය, අටුපත්දෙනිය, කඩිගමුව, හපුගහගෙදර, හරන්කහව | අරලියවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 12. | පිරිස්යාල, කිනදෙනිය, බජ්ජන්ගොඩ, තෙන්නගම, කිනදුරේ සහ කන්ඩපලිය | හපුගහවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 13. | තලගම, මාකුර, කැබෙල්ලවිට සහ බලතේව | දෙල්ගහවත්ත නමැති ඉඩමේදී | 17.8.58 |
| 14. | බෝතලේ පහළගම සහ අඩුපෙ, | හොරගොල්ල නමැති ඉඩමේදී | 25.8.58 |
| 14ඒ. | බෝතලේ ඉහළගම | මීරිස්වත්ත නමැති ඉඩමේදී | 25.8.58 |
| 15. | විල්වත්ත, තවලම්පිටිය, පොත්තෙමුල්ල සහ මුරුගම්පොල, හන්දුරුමුල්ල | දවටගහවත්ත නමැති ඉඩමේදී | 17.8.58 |
| 15ඒ. | නැලිගම | රුක්අත්තනගහවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 16. | කිදිවෙල, හලුගම සහ ලින්දර | මුත්තෙට්ටුවත්ත නමැති ඉඩමේදී | 25.8.58 |
| 17. | සොහොන්නරුව | බෙලිගහවත්ත නමැති ඉඩමේදී | 16.8.58 |
| 18. | පල්මඩ සහ පොහොන්නරුව හන්දුරුමුල්ල | මීල්ලගහවත්ත නමැති ඉඩමේදී | 23.8.58 |
| 19. | හේනෙපොල, පන්නල්පිටිය, පමුණුවත්ත සහ හිදියවල | දෙමටගහවත්ත නමැති ඉඩමේදී | 25.8.58 |
| 20. | වේවැල්දෙනිය ඉහලගම, පලපිටිය සහ මිල්ලවල | අඹගහවත්ත නමැති ඉඩමේදී | 21.8.58 |
| 20ඒ. | වේවැල්දෙනිය පහලගම | කටුකන්ගහවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 21/22 | මඩබාවිට, අරුන්ගොඩ, පනාවල, සියඹලාගොඩ, දන්ඕවිට, නව්ගල, කැලැපිටිගම | කොස්ගහවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 23. | කොටදෙනිය සහ වේරගොඩ | දුම්මලදෙනිය නමැති ඉඩමේදී | 24.8.58 |
| 24. | මුරුතවල | දෙල්ගහවත්ත නමැති ඉඩමේදී | 23.8.58 |
| 25. | හාපිටිගම, මක්කිනිගොඩ සහ බටලීය | කහටගහවත්ත නමැති ඉඩමේදී | 16.8.58 |
| 26/27. | කල්එලිය පල්ලෙවෙල, හිරිවලමුල්ල, කල්එලිය උඩවෙල, මීදෙල්ලගොමුව | කම්මලේවත්ත නමැති ඉඩමේදී | 31.8.58 |
| 28. | මල්ලැහව සහ බෝලාන | දන්සැල්හේන නමැති ඉඩමේදී | 17.8.58 |
| 28ඒ. | කල්එලිය වැල්ලවිලමුල්ල, කල්එලිය වැබොඩමුල්ල සහ රද්දල්ගොඩ | තානායම් ගොඩැල්ල නමැති ඉඩමේදී | 10.8.58 |
| 29/30. | මිදෙල්ලවල, රන්දෙනි පල්ලෙවෙල, වල්බෝලාන සහ වේරගොඩ | දෙනියකැලේ වත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 31. | බොකලගම, අම්බලන්වත්ත සහ බොකලගම දෙළහේන | ගොරකගහවත්ත නමැති ඉඩමේදී | 16.8.58 |
| 31ඒ. | බොකලගම ඉහලගම, බොකලගම පැලහිටියාව | කෝන්ගහවත්ත නමැති ඉඩමේදී | 15.8.58 |
| 32. | කුකුල්නාපෙ සහ පැලහිටිගම | කහටගහවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 33. | හංවපොල සහ දැත්ගම | හුරිගහවත්ත නමැති ඉඩමේදී | 22.8.58 |
| 34. | මුද්දරගම, පාතගම, හිරිකුළුව, මාන්ගෙදර සහ ගණේමුල්ල | කහටගහවත්ත නමැති ඉඩමේදී | 23.8.58 |
| 35. | බාදුරාගොඩ සහ කැප්පිටිවලාන | බෝගහවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 36. | ගස්පෙ | කැටකාලගහවත්ත නමැති ඉඩමේදී | 21.8.58 |
| 37/38. | උඩුඋල්ල, හිදියවල, ඉබුලන්වල සහ දහෙන්පහුව | මීගහවත්ත නමැති ඉඩමේදී | 17.8.58 |
| 39. | කොස්සැටදෙනිය | දූන්වත්ත නමැති ඉඩමේදී | 16.8.58 |
| 40. | ඉදිපරපෙ, අම්බන, යාපලාන, හීණමුල්ල, ගිරිවල, ගණේගොඩ සහ සියඹලාගොඩ | මල්ලැහවපිල්ලෑව නමැති ඉඩමේදී | 17.8.58 |
| 41. | පරණ හල්පෙ | කහවගහවත්ත නමැති ඉඩමේදී | 15.8.58 |
| 42. | හල්පෙ | හල්පේ ප්‍රජාමණ්ඩලය පිහිටා ඇති ඉඩමේදී | 24.8.58 |
| 43. | කිතුල්වල | දෙල්ගහවත්ත නමැති ඉඩමේදී | 16.8.58 |
| 44. | වත්තේමුල්ල සහ කලුඅග්ගල පහලගම | හුන්ගන්වල ගොඩැල්ල නමැති ඉඩමේදී | 24.8.58 |
| 45. | කුලීගෙදර සහ පිටියගෙදර | අන්කෙළිපිටියවත්ත නමැති ඉඩමේදී | 26.8.58 |
| 46. | කළුඅග්ගල ඉහලගම, මඩිතියවල සහ කරව්ව | දවටගහවත්ත නමැති ඉඩමේදී<br>ගොන්නගහමුලවත්ත නමැති ඉඩමේදී | 10.8.58<br>31.8.58 |
| 47/48 | හගවත්ත, නාන්නාපිටිය සහ රස්සපාන | වතියායකැලේවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 49. | උල්ලලපොල | දෙල්ගහවත්ත නමැති ඉඩමේදී | 23.8.58 |
| 50. | බිලගල්ල | පුස්වැල් අගාරවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 51. | කුඩගම්මන | සියඹලාගහවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 52. | හෙට්ටිමුල්ල, යටිමීය, හල්ඹළුව, ලොලව, කැලැගෙදර සහ පොත්තෙගෙදර | වෙලේවත්ත නමැති ඉඩමේදී | 24.8.58 |
| 53. | නාවාන | කහටගහවත්ත නමැති ඉඩමේදී | 31.8.58 |
| 53ඒ. | පරගොඩ, දියගම්පොළ, දිවුල්දෙනිය, කරවිලකුඹුර සහ කරබොටුවාව | කන්දබඩවත්ත නමැති ඉඩමේදී | 23.8.58 |
| 54. | කොටදෙනියාව, එරබද්ද, වැලිහිඳ සහ ගලිම්බුරේ | යකඩගල්ලවත්ත නමැති ඉඩමේදී | 10.8.58 |
| 54ඒ. | පොල්වත්ත, පුසුලගම්මන සහ මානින්ගොමුව | පේරමලකටුව නමැති ඉඩමේදී | 24.8.58 |

**දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන්.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, **සුප්‍රිම් උසාවියේ** පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා **1958 ජනවාරි 1 වැනි දින සිට** අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කායර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... .. | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | 1 වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... .. | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| 1 වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... .. | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. **මෙය කොළඹ, රජයේ ප්‍රකාශන කායර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**



ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.